**ශීර්ෂය 257- කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණය ද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන් දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 257 - කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජූලි 16 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්ය සාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිදුකරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.10 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත්බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන් දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණභාවයෙන් යුක්තව සැලසුම්කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරීම | 2.5 |
| | | 2. අග්‍රිම ඇස්තමේන්තු පිළියෙල කිරීමේ අඩුපාඩු | 2.7(අ) |
| | | 3. ලේඛන හා පොත් පවත්වා නොතිබීම | 2.9 |
| | | 4. අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගැනීම | 2.2 (අ) (I) |
| | | 5. ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම | 2.1.1 |
| | | 6. සැලසුම් කල ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම. | 2.1.2 |
| 128(1)(ආ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.6 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.2 |

| | | |
|---|---|---|
| | යොදවනු ලබන බව, ඒවා වරින් වර සත්‍යාපනය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | |
| 128(1)(ජ) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදුවී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/ සේවකයන් මත අධිභාර පනවනු ලබන බව (වගබලා ගැනීම පිණිස ප්‍රමාණවත් විධිවිධාන යෙදීම විශේෂයෙන් ඔහුගේ යුතුකම් භාරය වන්නේය.) | 1. රජයේ වත්කම් අවභාවිතා කිරීම 2.2(ආ)<br>2. පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම 2.2(ඇ)<br>3. මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු 2.3<br>4. පාඩු හා හානි 2.4 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 කාර්යසාධනය

#### 2.1.1 ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රධාන කාර්යභාරයන් ඉටුකිරීම සඳහා පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර තිබුණත් එම ව්‍යාපෘති නිම නොකර අතහැර තිබුණි.

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කල වර්ෂය | 2017දෙසැම්බර්31 දින වන විට වියදම | අතහැර දැමීමට හේතු |
|---|---|---|---|---|---|
| | | රු. | | රු. | |
| (i) | වලල්ලාවිට ඉත්තැපාන දකුණ මාලඹේහේන ආදාහනාගාරය | 8,116,833 | 2014 | 8,732,219 | දාහකයන් ඉදිකර නොතිබීම |
| (ii) | මිල්ලනිය වැලිකල සේවා පියස ගොඩනැගිල්ල | - | 2014 | 2,500,000 | වැඩ අවසන් කර නොතිබීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| (iii) | බුලත්සිංහල දිවලකඩ සෞඛ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල | - | - | 500,000 | මුදල් වෙන් නොකිරීම |
| (iv) | බුලත්සිංහල පොලේගොඩ බටහිර ප්‍රජා ශාලාව | - | 2014 | 1,000,000 | විවෘත කර නොතිබීම |
| (v) | අගලවත්ත උඩුවෙල රැස්වීම් ශාලාව | - | 2014 | 4,030,174 | වැඩ අවසන් නොකිරීම |
| (vi) | අගලවත්ත වඳුරබ්බ ප්‍රජා ශාලාව | - | 2015 | 983,276 | වැඩ අවසන් නොකිරීම |
| (vii) | අගලවත්ත යටියන නැගෙනහිර ගොඩඋඩහේන ප්‍රජාශාලාව | - | 2014 | 490,200 | වැඩ අවසන් නොකිරීම |
| (viii) | හොරණ කිදෙල්පිටිය ජල ව්‍යාපෘතිය | - | 2011 | 400,000 | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම |
| (ix) | බණ්ඩාරගම 661ඒ කොතලාවල ග්‍රාම නිලධාරී වසමේ සේවා පියස | 1,250,000 | 2016 | 100,000 | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම |
| (x) | පොතුවිල ආදාහනාගාරය | 14,172,680 . | 2014 | 7,205,467 | දාහකය ඉදිකර නොතිබීම |
| (xi) | බැල්ලපිටිය ප්‍රාථමික විද්‍යාලයේ නව ගොඩනැගිල්ල | 1,939,646 | 2014 | 1,397,561 | වැඩ අවසන් කර නොතිබීම |
| (xii) | මැදගම හඳුන්තැන්න ආදාහනාගාරය ඉදිකිරීම | 19,145,870 | - | 8,523,967 | වැඩ අවසන් කර නොතිබීම |
| | | | | 35,862,864 | |

## 2.1.2 සැලසුම් කළ ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම

ගම් පුළුල් කිරීමේ වැඩසටහන යටතේ 2001 වර්ෂයේ ඉංගිරිය 620 ඩී නිමලගම ග්‍රාම නිලධාරී වසමේ සොයිසා වත්තට අයත් ඉඩමෙන් රු. මිලියන 98 කට මිලදී ගෙන තිබූ හෙක්ටයාර 40.957 ක් අතරින් රු.මිලියන 54 ක් වටිනා හෙක්ටයාර 22.58 ක ඉඩම් ප්‍රමාණයක් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ නොකිරීම නිසා මේ දක්වා භාවිතයෙන් බැහැරව තිබුණි.

| යෝජිත ව්‍යාපෘතියේ නම | වෙන්කර තිබූ ඉඩම් ප්‍රමාණය |
|---|---|
| | හෙක්ටයාර |
| ක්‍රීඩා පිටිය | 5.0 |
| පාසල | 2.4281 |
| ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 6.0312 |
| ඔසු උයන | 3.1250 |
| රුවන්පුර අධිවේගී මාර්ගය සඳහා | 6.0 |
| | **22.5843** |

## 2.2 වත්කම් කළමනාකරණය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

### (අ) රජය සතු වත්කම් උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතා නොකිරීම

(i) දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රය තුළ 2015 වර්ෂයේ රුපියල් මිලියන 127.84 ක් වැයකර වායු සමීකරණය කරන ලද ආසන 850 කින් යුත් නව ශ්‍රවනාගාරයක් ඉදිකර තිබුණි. 2016 ජුනි 04 දින විවෘත කර තිබූ මෙම ශ්‍රවනාගාරයේ එදින සිට 2017 නොවැම්බර් 30 දක්වා දර්ශන වාර හා වැඩසටහන් 13ක් පවත්වා ඉපයූ ආදායම රු.875,000 ක් වූ නමුත් එම කාලය තුළ නඩත්තු වියදම වශයෙන් රු.1,735,750 ක මුදලක් වැය කර තිබුණි.

(ii) බේරුවල මාලේවන්ගොඩ සේවා පියස, හොරණ උතුර ඔසුසල සහ බුලත්සිංහල නිග්ගල පාහියංගල විවේකාගාරය පිළිවෙලින් වසර 3 ක සිට 5 ක් දක්වා කාලයක් භාවිතයට ගෙන නොතිබුණි.

**(ආ) රජයේ වත්කම් අවභාවිතා කිරීම**

පානදුර වලාන ග්‍රාම නිලධාරී වසමේ රක්ෂිත ඉඩමක අනවසරයෙන් කර තිබූ ඉදිකිරීම් ඉවත් කරන ලෙසට 2005 වර්ෂයේ මහේස්ත්‍රාත් අධිකරණය නියෝග කර තිබූ නමුත් මේ දක්වා එම නියෝගය ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ඇ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

(i) 2002 වර්ෂයේ ක්‍රියාත්මක වූ දින 100 වැඩසටහන යටතේ 633 කනන්විල ග්‍රාම නිලධාරි වසමේ නාගහකන්දවත්ත ඉඩමෙන් හෙක්ටයාර් 5.048 ක ප්‍රමාණයක් ජනතාවට බෙදා දී තිබූ අතර මේ දක්වා එම ඉඩම රජයට පවරා ගෙන නොතිබුණි.

(ii) බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හෙට්ටිමුල්ල ග්‍රාම නිලධාරී වසමේ රු. 1,864,499 ක් වැයකර ඉදිකර තිබූ සේවා පියසට අයත් ඉඩම පෞද්ගලික ඉඩමක් වූ අතර එහි අයිතිය රජයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

2017 මැයි මස බලපෑ ගංවතුර ආපදා තත්ත්වයන්හීදී කළුතර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ 15 කට අයත් පුද්ගලයන් 7,089 ක් සඳහා 2017 මැයි මස 27 සිට 2017 ජුනි 01 අතර කාලය තුළ පිසූ ආහාර පාර්සල් 62,376 ක් සැපයූ බවට සාවද්‍ය බිල්පත් හා ලේඛන ඉදිරිපත් කර රු.6,770,210 ක මුදලක් ග්‍රාම නිලධාරීන් 15 දෙනකු විසින් ලබාගෙන ඇති බවට වාර්තා වී තිබුණි.

**2.4 පාඩු හා හානි**

බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විශ්‍රාම වැටුප් ලබා ගන්නා පුද්ගලයින් අතරින් 2006-2016 අතර කාලය තුළ මිය ගිය පුද්ගලයින් 5 දෙනකු වෙනුවෙන් විශ්‍රාම වැටුප් ලෙස ගෙවා තිබූ රු.3,023,699 ක මුදලින් රු.2,293,295 ක මුදලක් අදාළ බැංකු වලින් ආපසු ප්‍රතිපූරණය කරගෙන තිබූ නමුත් රු.730,404 ක මුදලක් අයකර ගැනීමට නොහැකිවී තිබුණි.

**2.5 කාර්යභාරයන් ඉටුකිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 5ක කාලය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| **වර්ෂය** | **වියදම් වර්ගය** | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 646.37 | 639.10 | 7.27 | 1.12 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මූලධන | 60.60 | 60.05 | 0.55 | 0.91 |
| | **එකතුව** | **706.97** | **699.15** | **7.82** | **1.11** |
| 2014 | පුනරාවර්තන | 613.07 | 612.20 | 0.87 | 0.14 |
| | මූලධන | 263.75 | 178.79 | 84.96 | 32.21 |
| | **එකතුව** | **876.82** | **790.99** | **85.83** | **9.79** |
| 2015 | පුනරාවර්තන | 796.20 | 795.59 | 0.61 | 0.17 |
| | මූලධන | 120.20 | 116.60 | 3.59 | 2.99 |
| | **එකතුව** | **916.40** | **912.19** | **4.20** | **0.46** |
| 2016 | පුනරාවර්තන | 834.0 | 832.62 | 1.38 | 1.06 |
| | මූලධන | 238.0 | 185.12 | 52.88 | 22.22 |
| | **එකතුව** | **1,072.0** | **1,017.74** | **54.26** | **5.06** |
| 2017 | පුනරාවර්තන | 848.44 | 832.99 | 15.45 | 1.82 |
| | මූලධන | 1,237.43 | 377.22 | 860.21 | 69.52 |
| | **එකතුව** | **2,085.87** | **1,210.21** | **875.66** | **41.98** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගංවතුර සහ නාය යාම් හේතුවෙන් හානියට පත් යටිතල පහසුකම් යථා තත්ත්වයට පත් කිරීම සඳහා රු. මිලියන 1,036.430 ක් ද ගොඩනැගිලි සහ ඉදිකිරීම් සඳහා රු.මිලියන 170 ක් ද වශයෙන් ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ශක්‍යතා අධ්‍යයනයක් හා ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළ කාර්යයන් ඉටු කිරීමෙන් පසු මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කිරීමට නොහැකි වීම නිසා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් රු.මිලියන 316.217 ක් හෙවත් සියයට 31 ක් හා රු.මිලියන 28.62 ක් හෙවත් සියයට 16 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

**(ආ)** මූලධන වැය විෂයයක් යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා බෙදාහැරීමට යෝජිත රු.මිලියන 1,036.43 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 37.25 ක් රඳවා ගෙන තිබුණි

**(ඇ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

**------------------------------------------------------------------------------------**

වෙනත් අමාත්‍යාංශ 31 ක් හා දෙපාර්තමේන්තු 15 ක් විසින් විවිධ කාර්යයන් සඳහා පිළිවෙලින් රු.මිලියන 3,457.47 ක් හා රු. මිලියන 414.28 ක් වශයෙන් එකතුව රු.මිලියන 3,871.75 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.මිලියන 2,868.65 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබූ ප්‍රතිපාදන වලින් රු.මිලියන 1,003.10 ක් හෙවත් සියයට 26 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ක්‍රීඩා අමාත්‍යාංශයේ රු.මිලියන 7.58 ක ප්‍රතිපාදන මත කැලිඩෝ වෙරළ තීරයේ 2017 වර්ෂයේ ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ඉදිකර තිබුණු ඇවිදීමේ මංතීරුව භාවිතයෙන් බැහැරව පවතින අතර මෙම භූමිය සමීපයෙන් කළු ගඟ ගලා බසින බැවින් අදාළ ආයතනවලින් අනුමැතීන් ද ලබා නොගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි.

(ii) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 08 ක් විසින් විවිධ කාර්යයන් ඉටුකිරීම සඳහා ලබා දී තිබූ එකතුව රු.මිලියන 1,160.89 ක ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට වැයකළ මුදල රු.මිලියන 416.22 ක් වීමෙන් අදාළ කාර්යයන් අවසන් නොකර ඉතිරි වූ ප්‍රතිපාදනය රු. මිලියන 744.67 ක් විය. එම ඉතිරිය ඒ ඒ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 53 ක සිට සියයට 79 ක් දක්වා පරාසයක ප්‍රතිශතයක් විය.

## 2.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 25701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 122.00 | 116.56 | 62.00 | 63.98 | 320.00 | 266.17 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

**හිඟහිටි ණය ශේෂය අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දිනට අයවීම්, හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු. 813,145 ක් වූ අතර එම හිඟහිටි ශේෂ මාස 03 ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණි. එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 2.7 අග්‍රිම ගිණුම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සැලසුම් කළ පරිදි නිශ්චිත කාල වකවානුවල අදාළ කාර්යයන් ඉටු නොකර ඒවා වර්ෂය අවසානයේ දී ඉටු කිරීමට යොදා ගැනීම හේතුවෙන් අවශ්‍ය අග්‍රිම භාණ්ඩාගාරය වෙතින් ලැබී නොතිබුණි. ඒ අනුව, ගංවතුර හා නාය යාම් හේතුවෙන් හානියට පත් යටිතල පහසුකම් යථා තත්ත්වයට පත්කිරීම සඳහා ලබාදුන් රු. මිලියන1,036 ක ප්‍රතිපාදනවලින් අග්‍රිම වශයෙන් ලබා දී තිබූ මුදල රු. මිලියන180.02 ක් වූ අතර වැඩසටහන් 02 ක ඉටුකරන ලද කාර්යයන් සඳහා මුදල් ගෙවා ගැනීමට නොහැකි වූ බිල්පත්වල වටිනාකම රු.මිලියන 584.80 ක් විය.

## 2.8 පොදු තැන්පත් ගිණුම්

---------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුම් 6 ක 2017 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන441.047 ක ශේෂයක් විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්ම වූ එකතුව රු. 9,187,619 ක් වූ තැන්පතු 10 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) මදුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අත්පත් කර ගැනීමේදී වන්දි මුදල් ලෙස ගෙවිය යුතු රු.මිලියන 6.86 ක මුදලක් 2010 වර්ෂයේ සිට තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

## 2.9 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ආ) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඇ) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | පවත්වා නොතිබුණි. |
| (ඈ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |
| (ඉ) | යතුරුපැදි හා ස්කූටර් ලබාදී ඇති රාජ්‍ය නිලධාරීන්ගේ ලේඛනය | ජාතික අයවැය අධ්‍යක්ෂ කාර්යාලයේ 2014 නොවැම්බර් 14 දිනැති BD/GPS/130/9/14/MC/1 දරන උපදෙස් මාලාව | පවත්වා නොතිබුණි. |

## 2.10 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

කාර්යභාරයන් ඉටුකිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රුපියල් මිලියන 744.39 ක් වැයකර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.322,245 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 75 | 68 | 7 |
| (ii) | තෘතියික මට්ටම | 56 | 39 | 17 |
| (iii) | ද්විතියික මට්ටම | 2,422 | 2,054 | 368 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 168 | 149 | 19 |
| | **එකතුව** | **2,721** | **2,310** | **411** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 හි සැලසුම් අංශයට අනුයුක්ත නිලධාරීන් 273 අතරින් නිලධාරීන් 56 දෙනකු වර්ෂ 5 ත් 19 ත් අතර කාලයක් එකම සේවා ස්ථානයක සේවය කරමින් තිබුණි.